# සිංහල අවධි විභක්ත්‍යර්ථය හා ආධාර විභක්ත්‍යර්ථය ලේඛන දෙමළ භාෂාවේ දී භාවිත ආකාරය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

උඩගලදෙණියේ ධම්මවිමල
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
dhammawimala@kln.ac.lk

**සාරසංක්ෂේපය**

විභක්ති යන්න පාළියේ 'විභත්ති' ලෙසින් ද සිංහලයේ 'විබත්' ලෙසින් ද අර්ථ ගැන්වේ. විභක්ති යන්නෙන් 'බෙදීම' යන්න අර්ථය හැඟවෙයි (විභජීයන්තීති විභත්තියෝ). ''වි'' පූර්ව තනාදි ගණික ''භජ්'' ධාතුවට 'ක්තින් (ති)' කෘත් ප්‍රත්‍යය එක් කිරීමෙන් සෑදෙන 'විභක්ති' යන්න ස්ත්‍රී ලිංග කෘදන්තයෙකි. 'නමින් පර වැ බෙදනු ලබනුයේ විබත් නම්' යනුවෙන් සිදත් සඟරා කතුවරයා අදහස් කරනුයේ නාම ප්‍රකෘතියක අර්ථය කර්තෘ, කර්ම, කරණ ආදි අර්ථයන් සඳහා බෙදා දක්වීමට උපකාර වන ප්‍රත්‍යය ලෙස යි. එමෙන් ම වාක්‍යයක නාම පදයන්හි ව්‍යාකරණ ක්‍රියාකාරිත්වය වෙනස් වීම විභක්තිය නම් වන බව දෙමළ ග්‍රන්ථවල විග්‍රහ කර ඇත. ව්‍යාකරණ ක්‍රියාකාරිත්වය යනු වාක්‍යයෙහි නාම පදයටත් ක්‍රියාපදයටත් අතර ඇති වාක්‍ය රීතිය බව හඟවයි. සිංහල මාතෘ භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ භාෂාව ඉගෙන ගැනීමේ දී විභක්ති ප්‍රයෝග කුමන ආකාරයකට භාවිත කිරීම සුදුසු වේද යන ගැටලුවට නිරතුරු ව මුහුණ දෙයි. ඒ අනුව මහාචාර්ය ඩබ්. එස්. කරුණාතිලකයන්ගේ **සිංහල භාෂා ව්‍යාකරණය** හා මහාචාර්ය එම්. ඒ. නුහ්මාන්ගේ **mbg;gilj; jkpo; ,yf;fzk;** (අඩිප්පඩෛත් තමිළ් ඉලක්කණම්) ග්‍රන්ථය ප්‍රාථමික මූලාශ්‍රයන් ලෙස භාවිත කෙරෙමින් සිංහල අවධි විභක්ත්‍යර්ථය හා ආධාර විභක්ත්‍යර්ථය ලේඛන දෙමළ භාෂාවේ දී භාවිත වන ආකාරය පිළිබඳ තුලනාත්මක ව අධ්‍යයනය කරන ලදී. සිංහල භාෂාවේ අවධි විභක්ති හා ආධාර විභක්තිය යනුවෙන් විභක්ති දෙකක් පැහැදිලි ව ම දක්නට තිබිය දී එකී විභක්ති අර්ථයන්ගෙන් ප්‍රකාශ කෙරෙන අර්ථයන් ලේඛන දෙමළ භාෂාවේ දී ප්‍රකාශ කිරීමට එක ම විභක්ති ප්‍රත්‍යයක් භාවිත වීම මෙයට බලපාන ප්‍රධාන කාරණයක් ලෙස ද පෙන්වා දිය හැකි ය. තව ද සිංහල මාතෘ භාෂකයා ස්වකීය අදහස් ඍජු ව දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමේ දී සිංහල විභක්තිවල භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබීම ම දෙමළ විභක්ති ප්‍රයෝග නිවැරදි ව භාවිත කිරීමට මෙන් ම අවබෝධ කරගැනීමට මනා පිටිවහලක් වන බව මෙහි දී අවධාරණය කර ගත හැකි ය.

**ප්‍රමුඛ පද:** අවධි විභක්තිය, ආධාර විභක්තිය, දෙවන බස, මව් බස, විභක්ති

# A Comparative Study on the Use of Meanings of Sinhalese Ablative Case and Locative Case in Written Tamil Language

Ven. Udagaladeniye Dhammawimala
Department of Linguistics, University of Kelaniya
dhammawimala@kln.ac.lk

## Abstract

The term case (*vibhakti)* is defined as '*vibhatti'* in Pāli and '*vibat'* in Sinhalese. '*Vibhajīyantīti vibhattiyō',* that is, case means 'division'. *Vibhakti* is a feminine participle formed by adding the participle suffix '*Ktin'* (*ti*) to the root *bhaj* with '*vi'* prefix. The author of the *Sidat Saňgarawa* said, '*namin para vä bedanu labanuyē vibat nam'; vibhakti* is the suffix that helps a noun stem to divide its meaning into agent, objective, instrument, etc. Further, it has been analysed in Tamil texts that the change of grammatical function of the nouns in a sentence is called the case. Grammatical function refers to the sentence rule between the noun and the verb in a sentence. The Sinhala native speaker is constantly faced with the problem of how to use methods of using cases appropriately when learning Tamil as a second language. Accordingly, *Sinhala Bhāshā Vyākaraṇaya* written by Prof. W.S. Karunathilake and *Aḍippaḍait Tamiḷ Ilakkaṇam* (*mbg;gilj; jkpo; ,yf;fzk;*) by Professor M.A. Nuhman have been used as primary sources, and a comparative study of the use of meanings of Sinhala Ablative Case and Locative case in written Tamil was conducted. According to the results of this study, it can be pointed out that while there are two cases in Sinhalese that are Ablative and Locative case, the fact that a single case suffix is used to express the meanings of those two cases in Tamil, is a major factor affecting Sinhala native speakers who study Tamil as a second language. Moreover, it can be emphasised here that when Sinhala native speakers directly translate their ideas into the Tamil language, having a correct understanding of the use of Sinhala cases itself will assist in using and understanding the methods of using cases in Tamil accurately.

**Keywords:** Ablative Case, Cases, Locative case, Native Language, Second Language